# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

# දැන්වීමයි

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2024 අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල අත්හිටුවා තිබූ අයදුම්කරුවන්ගෙන් 2024/2025 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්පත් කැඳවීම.**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2024 අ.පො.ස (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මීට පෙර අත්හිටුවා තිබූ අයදුම්කරුවන්ගෙන් **2025** ජුනි **17** වන දින සිට **2025** ජූලි **1** වන දින දක්වා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා මාර්ගගතව අයදුම්පත් කැඳවීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තීරණය කර ඇත.

අයදුම්පත් ඉදිරිපත් කිරීම පිළිබඳ වැඩිදුර තොරතුරු, 2024/2025 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්පත් කැඳවීම පිළිබඳව මීට පෙර පළ කරන ලද පුවත්පත් දැන්වීමේ සඳහන් කර ඇති අතර එය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා නිල වෙබ් අඩවියේ (www.ugc.ac.lk) පළ කර ඇත.

වැදගත්

මෙම අවස්ථාවේ දී, පාඨමාලා සඳහා වන කැමැත්තේ අනුපිළිවෙළ අන්තර්ජාලය හරහා වෙනස් කිරීම සඳහා අයදුම්පත් භාර ගන්නා අවසන් දින සිට සතියක කාලයක් පමණක් ලබා දෙනු ලබන බව කරුණාවෙන් සලකන්න.

තව ද, අදාළ විශ්වවිද්‍යාල/මණ්ඩප/උසස් අධ්‍යාපන ආයතන විසින් ප්‍රායෝගික/යෝග්‍යතා පරීක්ෂණ පවත්වන ලද අධ්‍යයන පාඨමාලා සඳහා අයදුම්කරු දැනටමත් පෙනී සිට නොමැති නම්, එම ප්‍රායෝගික/යෝග්‍යතා පරීක්ෂණ පවතින අධ්‍යයන පාඨමාලා සඳහා මෙම අවස්ථාවේ දී අයදුම් කිරීමට නොහැකි බව ද කරුණාවෙන් සලකන්න.

සභාපති
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
2025.06.17